OL/2017/63/S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 63 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II | පැය තුනයි |
| முயற்சியாண்மைக் கற்கை | I, II | மூன்று மணித்தியாலம் |
| Entrepreneurship Studies | I, II | Three hours |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** අවදානම් සහිත ව්‍යාපාරික අවස්ථාවක් ග්‍රහණය කර ගැනීමෙන් නව නිපැයුම් බිහි කිරීමේ ශක්තිය
(1) අවිනිශ්චිතතාව නම් වේ. (2) ව්‍යවසායකත්වය නම් වේ.
(3) කළමනාකරණය නම් වේ. (4) අධිෂ්ඨානශීලීත්වය නම් වේ.

**2.** නිෂ්පාදිත නම්‍යතාවයට උචිත පරිදි වෙළෙඳපොළ තත්ත්ව සකස්ව **නොතිබීම**
(1) අවිනිශ්චිතතාව වේ. (2) අවදානම වේ. (3) හිඳැස වේ. (4) අනම්‍යශීලී බව වේ.

**3.** ව්‍යවසායකත්වය හරහා ජනිත වන ව්‍යාපාර හරහා නව රැකියා අවස්ථා බිහි වීම ව්‍යවසායකත්වයේ
(1) ජාතික මට්ටමේ ප්‍රතිලාභයකි. (2) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිලාභයකි.
(3) පුද්ගල මට්ටමේ ප්‍රතිලාභයකි. (4) ග්‍රාමීය මට්ටමේ ප්‍රතිලාභයකි.

**4.** ව්‍යවසායකත්ව ව්‍යාපාර නිසා ප්‍රතිලාභ ලබන මූලික පාර්ශ්ව දෙකක් වනුයේ
(1) රජය සහ සමාජය වේ. (2) පාරිභෝගිකයා සහ රජය වේ.
(3) සේවකයා සහ සේව්‍යයා වේ. (4) ගනුදෙනුකරු සහ තැරැව්කරු වේ.

**5.** පියල් මෝටර් රථ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය තුළින් සම්පූර්ණ කරනුයේ,
(1) වුවමනාවකි (2) අවශ්‍යතාවකි. (3) ඉල්ලුමකි. (4) වගකීමකි.

**6.** ව්‍යාපාර පරිසරයේ සිදු වන වෙනස්වීම් වහා ම හඳුනාගෙන ව්‍යාපාර අවස්ථා බවට පත් කර ගැනීමට ඇති හැකියාව,
(1) පරිකල්පනික චින්තනය වේ. (2) දැක්ම වේ.
(3) නිරීක්ෂණශීලී බව වේ. (4) ක්‍රියාකාරී බව වේ.

**7.** පුද්ගල ආකල්ප, පරම්පරාගත සිරිත්, විශ්වාස යනාදිය ව්‍යවසායකත්වය සංවර්ධනය වීම කෙරෙහි ඇති අභියෝග වේ. මේවා අයත් වනුයේ
(1) මනෝවිතීතිය (Mindset) යටතට ය. (2) සංස්කෘතිය යටතට ය.
(3) ආගම යටතට ය. (4) පවුල යටතට ය.

**8.** සමාජයීය ව්‍යවසායකත්වයේ අරමුණ වනුයේ
(1) මූල්‍යමය ප්‍රතිලාභ උපරිම කිරීමයි. (2) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ නැංවීමයි.
(3) සමාජයීය සුභසාධනය උදෙසා කටයුතු කිරීමයි. (4) මානව ප්‍රාග්ධනයේ ගුණත්වය වැඩි කිරීමයි.

**9.** පාසල් අලුත්වැඩියා කිරීම සමාජ ව්‍යවසායකත්වයේ
(1) ජාතික මට්ටමේ ක්‍රියාවකි. (2) ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාවකි.
(3) ග්‍රාමීය මට්ටමේ ක්‍රියාවකි. (4) පුද්ගල මට්ටමේ ක්‍රියාවකි.

**10.** සමාජ ව්‍යවසායකයන් බිහිවීමට හේතුවක් **නොවන්නේ**
(1) මානව දයාවයි. (2) පරාර්ථකාමී බවයි. (3) ආත්ම තෘප්තියයි. (4) ලාභයයි.

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**11.** කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමට භාවිත කරනු ලබන ගුණාත්මක නිර්ණායකයක් වනුයේ
(1) සේවක සංඛ්‍යාවයි. (2) භාවිත කරන තාක්ෂණයයි.
(3) නිෂ්පාදන ධාරිතාවයි. (4) භාවිතයට ගන්නා බල ශක්ති ප්‍රමාණයයි.

**12.** කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණයක් වනුයේ
(1) ආයෝජනය ඉහළ අගයක් ගැනීම ය. (2) වෙළෙඳපොළ පුළුල් වීම ය.
(3) ස්වාධීන කළමනාකරණය ය. (4) නිමැවුම් හා විකුණුම් පරිමාව ඉහළ වීම ය.

**13.** පහත පිළිතුරු අතුරෙන් වුවමනා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ආහාර, රොටී, ගවුම් (2) ඇඳුම්, ආහාර, කලිසම්
(3) ආහාර, ගවුම්, කමිස (4) බත්, කමිස, සූප්

**14.** සමාජය තුළ නායකත්වයක් හිමිවීම ව්‍යවසායකත්වයේ
(1) සමාජයීය ප්‍රතිලාභයකි. (2) මූල්‍යමය ප්‍රතිලාභයකි.
(3) මානසික තෘප්ත ප්‍රතිලාභයකි. (4) පුද්ගල ප්‍රතිලාභයකි.

**15.** ව්‍යාපාරය සඳහා වැය කරන ලද ශක්තිය ව්‍යවසායකත්වයේ
(1) තර්ජනයකි. (2) පිරිවැයකි. (3) ප්‍රතිලාභයකි. (4) අවස්ථාවකි.

**16.** තොරතුරු සන්නිවේදනය කිරීම තුළින් ව්‍යවසායකයා ඉටු කරනුයේ
(1) අයිතිකරු ලෙස වූ භූමිකාව වේ. (2) කළමනාකරු ලෙස වූ භූමිකාව වේ.
(3) නායකයා ලෙස වූ භූමිකාව වේ. (4) සේවකයා ලෙස වූ භූමිකාව වේ.

**17.** විද්‍යුත් සංඥා සන්නිවේදන ක්‍රමයට උදාහරණයක් වනුයේ
(1) විදුලි පණිවුඩ වේ. (2) වර්ණ සලකුණු වේ. (3) විද්‍යුත් තැපැල වේ. (4) විදුලි සීනුව වේ.

**18.** ව්‍යාපාර සඳහා ජල හා විදුලිබල පහසුකම් ලබාදීම අයත් වනුයේ
(1) යටිතල පහසුකම් යටතට ය. (2) අලෙවි පහසුකම් යටතට ය.
(3) මෙහෙයුම් පහසුකම් යටතට ය. (4) තාක්ෂණික පහසුකම් යටතට ය.

**19.** කම්කරුවන්, පෙදරේරුවන් ව්‍යාපාරයට සපයන ශ්‍රමය
(1) බුද්ධිමය ශ්‍රමය වේ. (2) කායික ශ්‍රමය වේ. (3) පුහුණු ශ්‍රමය වේ. (4) නුපුහුණු ශ්‍රමය වේ.

**20.** මානව සම්පත පිළිබඳ අධ්‍යයනයේ දී සැලකිල්ලට ගනු ලබන ආදායම, පරිභෝජන රටාව, ඉතිරි කිරීම් යනාදිය අයත් වනුයේ
(1) ප්‍රජා විද්‍යාත්මක සාධක යටතට ය. (2) මනෝවිද්‍යාත්මක සාධක යටතට ය.
(3) ආර්ථිකමය සාධක යටතට ය. (4) සමාජ විද්‍යාත්මක සාධක යටතට ය.

**21.** වත්කම්, බද්දට මිල දී ගැනීමේ දී ඊට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම හඳුන්වනුයේ,
(1) බැංකු අයිරා පහසුකම් ලෙස ය. (2) වෙළෙඳ ණය පහසුකම් ලෙස ය.
(3) විලම්බිත ගෙවුම් පහසුකම් ලෙස ය. (4) කල්බදු පහසුකම් ලෙස ය.

**22.** ව්‍යාපාර ලෝකයේ තරගකාරීත්වය නිරන්තරයෙන් වෙනස්වීමට භාජනය වේ. මෙය හැඳින්විය හැක්කේ,
(1) අවිනිශ්චිතතාව ලෙස ය. (2) නිශ්චිතතාව ලෙස ය.
(3) අභියෝගතාව ලෙස ය. (4) ව්‍යාපාර පරිසරය ලෙස ය.

**23.** ව්‍යවසායකයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යවසායකයන් සැමවිට ම ලාභ අරමුණු කරගෙන ව්‍යාපාරවල නිරත වේ.
(2) ව්‍යවසායකයන් උත්පත්තියෙන් පමණක් බිහි වේ.
(3) ව්‍යවසායකයන් උත්පත්තියෙන් බිහි නොවන අතර නිර්මාණය කළ හැකි ය.
(4) ව්‍යවසායකයන් උත්පත්තියෙන් බිහි වන අතර නිර්මාණය ද කළ හැකි ය.

**24.** ව්‍යවසායකයින් සඳහා නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සැලකිය හැක්කේ,
(1) සීමාකාරී සාධකයක් ලෙස ය. (2) අභියෝගයක් ලෙස ය.
(3) අවස්ථාවක් ලෙස ය. (4) තරගකාරී වාසියක් ලෙස ය.

**25.** ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) අයිතිකරුවන්, කළමණාකරුවන්, සේවකයන් (2) ගනුදෙනුකරුවන්, මිල මට්ටම්, පරිභෝජනය
(3) සාරධර්ම, වයස් ව්‍යුහය, ආකල්ප (4) සේවකයන්, ගනුදෙනුකරුවන්, රාජ්‍ය ප්‍රතිපත්ති

[ තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**26.** විවිධ ක්‍රම උපයෝගී කර ගනිමින් භාණ්ඩයක හැසිරීම පිළිබඳ තොරතුරු රැස් කර ගැනීම
(1) වෙළෙඳපොළ සමීක්ෂණය වේ. (2) වෙළෙඳපොළ ඛණ්ඩනය වේ.
(3) පාරිභෝගික ඉලක්කකරණය වේ. (4) වෙළෙඳපොළ ප්‍රවර්ධනය වේ.

**27.** පුද්ගලයින් මුහුණ දෙන ගැටළුවලට විසඳුමක් ලෙස ව්‍යවසායකයකු තුළ පහළ වන සිතුවිල්ල හඳුන්වනුයේ
(1) ව්‍යාපාර අවස්ථාව ලෙස ය. (2) සඵල ඉල්ලුම ලෙස ය.
(3) ආයෝජනය ලෙස ය. (4) ව්‍යාපාර අදහස ලෙස ය.

**28.** සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අකමැත්ත නිසා
(1) භාණ්ඩවල ගුණත්වය තහවුරු වේ. (2) ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වේ.
(3) නවෝත්පාදන බිහි නොවේ. (4) ලාභයට බලපෑම් ඇති නොවේ.

**29.** පාවහන් නිෂ්පාදකයකුට අමුද්‍රව්‍ය සැපයුම්කරුවකු යනු
(1) ඉදිරිපස ව්‍යාපාරයකි. (2) ආදේශක ව්‍යාපාරයකි.
(3) පසුපස ව්‍යාපාරයකි. (4) ප්‍රතිබද්ධ ව්‍යාපාරයකි.

**30.** වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීමට යොදා ගන්නා ජන විකාශ සාධකයක් වනුයේ
(1) ජන සංඛ්‍යාවයි. (2) ස්ත්‍රී/පුරුෂ භාවයයි. (3) ජන ඝනත්වයයි. (4) ජීවන රටාවයි.

**31.** ව්‍යාපාරයක් විසින් විකිණීම සඳහා රු. 60 000 ක භාණ්ඩ මිල දී ගැනීම, මූලික ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරනුයේ,
(1) හිමිකම් අඩු වීම රු. 60 000 වගකීම් වැඩි වීම රු. 60 000
(2) වත්කම් අඩු වීම රු. 60 000 හිමිකම් වැඩි වීම රු. 60 000
(3) වත්කම් අඩු වීම රු. 60 000 වත්කම් වැඩි වීම රු. 60 000
(4) වගකීම් අඩු වීම රු. 60 000 වගකීම් වැඩි වීම රු. 60 000

**32.** බැංකු අයිරා පහසුකමක් ලබා ගැනීම ව්‍යාපාරයක ශේෂ පත්‍රය තුළ ඇතුළත් කරනුයේ
(1) ජංගම වගකීමක් ලෙස ය. (2) ජංගම වත්කමක් ලෙස ය.
(3) ජංගම නොවන වගකීමක් ලෙස ය. (4) ජංගම නොවන වත්කමක් ලෙස ය.

**33.** ඇඟළුම් කම්හලක් විසින් භාවිත කරන රෙදි සඳහා දරන පිරිවැය
(1) වෙනත් සෘජු පිරිවැයකි. (2) සෘජු ද්‍රව්‍ය පිරිවැයකි.
(3) වක්‍ර ද්‍රව්‍ය පිරිවැයකි. (4) වෙනත් වක්‍ර පිරිවැයකි.

**34.** තනතුරක ඇති ප්‍රධාන මූලිකාංග ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) වගකීම්, සුදුසුකම්, වරප්‍රසාද (2) වගකීම්, වරප්‍රසාද, රාජකාරි
(3) කටයුතු, සුදුසුකම්, වගකීම් (4) කටයුතු, රාජකාරි, වගකීම්

**35.** ව්‍යාපාරයක මුදල් ගලා ඒම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) වැටුප්, විකුණුම්, බදු මුදල් (2) ණය, රක්ෂණ, වැටුප්
(3) ණය, විකුණුම්, ගොඩනැගිලි කුලී ආදායම (4) ණය, බදු මුදල්, රක්ෂණ

- පහත සිද්ධිය කියවා අංක **36** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තම අධ්‍යාපන කටයුතු නිම කළ මන්දුලගේ එක ම සිහිනය වූයේ තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමයි. ඇඩි කැපවීමෙන් සහ අධිෂ්ඨානශීලී බවින් යුත් ඔහු සුළු මුදලක් යොදවා සුවඳ විලවුන් නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ආරම්භයේ දී නෑදෑ හිතමිතුරන්ගෙන් ඔහුට විවිධ විවේචන පැමිණිය ද ඒවා ඉවසීමෙන් දරා ගත් ඔහු තම අරමුණ කරා සම්පත් මෙහෙයවූයේ ය. වෙළෙඳපොළේ පවතින විශාල සුවඳ විලවුන් බෝතල් වෙනුවට කුඩා බෝතල්වල බහාලමින් තම නිෂ්පාදිතය ඉදිරිපත් කළ ඔහු පවත්නා තරගකාරී මිලට සාපේක්ෂව අඩු මිලකට නිෂ්පාදිතය අලෙවි කළේ ය. පසුව මෙම නිෂ්පාදිතය සඳහා වූ ඉල්ලුම ඉහළ ගිය අතර මුදල් ආයෝජනයට එකඟ වූ තම මිතුරා වූ සහන් ද සමඟ එකතුව ලාභ අලාභ සම සම ව බෙදා ගනිමින් ව්‍යාපාරය තවදුරටත් පුළුල් කර සාර්ථක කර ගැනීමට ඔවුන්ට හැකි විය.

**36.** තමාගේ ම ව්‍යාපාරයක් ඇරඹීමට මන්දුල තුළ වූ ඇඩි කැපවීම සහ අධිෂ්ඨානශීලී බව
(1) ශක්තියකි. (2) දුර්වලතාවකි. (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

**37.** ව්‍යාපාරය ආරම්භයේ දී නෑදෑ හිතමිතුරන්ගෙන් එල්ල වූ බාධාවන් ව්‍යවසායකත්ව සංවර්ධනයට අභියෝගයකි. මෙය අයත් වනුයේ කිනම් අභියෝගය යටතට ද?
(1) මනෝවිද්‍යාත්මක (2) ආගම (3) පවුල (4) සංස්කෘතිය

[ හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**38.** සුවඳ විලවුන් කුඩා බඳුන්වල බහාලමින් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම හැඳින්විය හැක්කේ

(1) හර නිෂ්පාදිතය ලෙස ය. (2) සත්‍ය නිෂ්පාදිතය ලෙස ය.
(3) වැඩි දියුණු කළ නිෂ්පාදිතය ලෙස ය. (4) නව නිෂ්පාදිතය ලෙස ය.

**39.** වෙළෙඳපොළේ දැනට පවත්නා තරගකාරී මිල පදනම් කර ගනිමින් තම නිෂ්පාදිතය මිල කිරීම හඳුන්වනුයේ

(1) ලකුණු කල මිල ක්‍රමය ලෙස ය. (2) අපේක්ෂිත වටිනාකම් මත මිල ක්‍රමය ලෙස ය.
(3) පුරෝකථන මිල ක්‍රමය ලෙස ය. (4) පවත්නා මිල ක්‍රමය ලෙස ය.

**40.** මෙම සිද්ධියට අනුව මන්දුල සහ සහන් පවත්වාගෙන යන ව්‍යාපාරය

(1) හවුල් ව්‍යාපාරයකි. (2) සමාගමකි. (3) සංස්ථාවකි. (4) සමිතියකි.

* *

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

OLD

63 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උසස් පෙළ අධ්‍යාපනය නිම කළ චමත් පාසල තුළ කැපී පෙනුන, දක්ෂ, නිර්මාණශීලී සිසුවෙකි. සිය ප්‍රතිඵල පැමිණෙන තුරු කාලය අපතේ නොයවා ව්‍යාපාරික කටයුත්තකට යොමු වීමට ඔහුට දැඩි කැමැත්තක් තිබුණි. නිමි ඇඳුම් ක්ෂේත්‍රයට යොමු වීමට ආශාවක් දැක්වූ ඔහු තීරණය කළේ ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා තම ප්‍රදේශයේ සිටින දක්ෂ ව්‍යාපාරිකයකු වන නාමල් මහතා හමු වීමට ය. නාමල් මහතා චමත්ට ලබා දුන් උපදෙස්වල සංක්ෂිප්තයක් පහත දැක්වේ.

ව්‍යවසායකයකු යනු නිරතුරුව ම අලුත් දේ පසුපස හඹායන්නකු බවත්, නිර්මාණශීලීව සිතිය යුතු අයකු බවත් නාමල් මහතා පැවසුවේ ය. තමා සතු සියලු ම අදහස් ව්‍යාපාර අවස්ථා නොවන බවත්, අදහස් ගැඹුරින් විශ්ලේෂණය කර හොඳ ව්‍යාපාර අවස්ථා හඳුනා ගත හැකි බවත් ඔහු දන්වන ලදී. ව්‍යාපාර අවස්ථාව හඳුනාගත් පසු ඊට සුදුසු සංවිධාන ක්‍රමයක් තීරණය කළ යුතු බවත් එහිදී ව්‍යාපාරයේ ප්‍රමාණය, ස්වභාවය, ස්වකීය කැමැත්ත වැනි කරුණු රාශියක් සලකා බැලිය යුතු බවත් ඔහු පැවසුවේ ය. බොහොමයක් ව්‍යාපාර ආරම්භ කර කෙටි කලකින් වැසී යන බවත්, ඊට ප්‍රධානතම හේතුව ව්‍යාපාරය පිළිබඳ නිවැරදි දැක්මක් නොමැතිකම බවත්, අවධාරණය කළ ඔහු ව්‍යාපාර සැලසුමක් නිවැරදිව පිළියෙල කිරීම තුළින් එම ගැටළුව මග හරවා ගත හැකි බව ද පැවසුවේ ය. එමෙන් ම ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය පිළිබඳ නාමල් මහතා විමසූ විට චමත් පවසන ලද්දේ සිය පියා හා සොහොයුරා අවශ්‍ය මුදල් ලබා දීමට එකඟ වී ඇති බවයි.

නාමල් මහතාට ස්තුතිය පුදකල චමත් නැවත පැමිණියේ ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරගෙන, නැවතත් ඔහු හමුවීමට පැමිණෙන බව ද ප්‍රකාශ කරමිනි.

(i) 'ව්‍යවසායකයා' යන්න ඔබේ වචනයෙන් දක්වන්න.
(ii) සාර්ථක ව්‍යවසායකයකු වීමට චමත් තුළ දැකිය හැකි ශක්තීන් **දෙකක්** ලියන්න.
(iii) හොඳ ව්‍යාපාරික අවස්ථාවක ලක්ෂණ **හතරක්** දක්වන්න.
(iv) ව්‍යාපාරයට සුදුසු සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු සාධක **හතරක්** ලියන්න.
(v) 'ව්‍යාපාර සැලසුමක' වැදගත්කම දැක්වීමට කරුණු **දෙකක්** සඳහන් කරන්න.

ව්‍යාපාර සැලසුම පිළියෙල කිරීමෙන් පසු සිය ව්‍යාපාර කටයුතු ඇරඹූ චමත්ගේ ව්‍යාපාරයේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03ට අදාළ තොරතුරු පහත සපයා ඇත.

| | රු. |
|---|---|
| ලී බඩු උපකරණ | 160 000 |
| අතැති මුදල් | 60 000 |
| ණයගැතියෝ | 40 000 |
| බැංකු ණය | 180 000 |
| ගෙවිය යුතු විදුලි වියදම් | 60 000 |
| අවසන් තොගය | 80 000 |
| ප්‍රචාරණ වියදම් | 40 000 |
| ප්‍රාග්ධනය | 200 000 |
| යන්ත්‍ර හා උපකරණ | 200 000 |

(vi) චමත්ගේ ව්‍යාපාරයේ මුදල් ගලා යාමක් සහ මුදල් ගලා ඒමක් සඳහා උදාහරණය බැගින් ලියන්න.
(vii) මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම ගණනය කරන්න.
(viii) මුළු වගකීම්වල වටිනාකම ගණනය කරන්න.
(ix) 2017.03.31 දිනෙන් අවසන් මාස තුන සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.
(x) 2017.03.31 දිනට චමත්ගේ ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

[ හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

2. (i) සංවර්ධනය වන ආර්ථිකයකට ව්‍යවසායකයකු දායකවන ආකාරය දැක්වීම සඳහා කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(ii) වර්තමාන පරපුර ඉතා දැඩි ලෙස තම සෞඛ්‍ය ගැන සැලකිලිමත් වේ. මේ සම්බන්ධයෙන් ව්‍යවසායකයකුට හඳුනාගත හැකි ව්‍යාපාර අවස්ථා **තුනක්** දක්වන්න.
(iii) ව්‍යවසායකත්ව සංවර්ධනයට බාහිර පරිසරය තුළින් ඇති වන බාධා සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකත්ව සංවර්ධනයට ඇති අභියෝග ජය ගැනීම සඳහා ව්‍යවසායකයකු සතුවිය යුතු ලක්ෂණ **හතරක්** දක්වන්න.
(v) ව්‍යවසායකත්වයේ පුද්ගල ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

3. (i) සමාජයීය ව්‍යවසායකත්වය සඳහා උදාහරණ **දෙකක්** දෙන්න.
(ii) සමාජයීය ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකු අපේක්ෂා කරන ප්‍රතිලාභ **හතරක්** දක්වන්න.
(iii) කාන්තා ව්‍යවසායකත්වය තුළින් පවුලට අත් වන වාසි **දෙකක්** දක්වන්න.
(iv) කාන්තා ව්‍යවසාය සංවර්ධනයට ඇති අභියෝග **හතරක්** සඳහන් කරන්න.
(v) කුඩා ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

4. (i) වර්තමාන පරිසරය තුළ හඳුනාගත හැකි නව ව්‍යාපාර අවස්ථා **දෙකක්** දක්වන්න.
(ii) නව නිෂ්පාදනයක් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී ව්‍යවසායකයකු මුහුණ දෙන අවදානම් **තුනක්** දක්වන්න.
(iii) ව්‍යවසායකයකු වීමට තීරණය කිරීම සඳහා බලපාන හේතු **දෙකක්** දක්වන්න.
(iv) ව්‍යාපාරික කටයුත්තකට පිවිසෙන ව්‍යවසායකයකුගේ සාර්ථකත්වයට බලපාන ප්‍රධාන කරුණු **හතරක්** දක්වන්න.
(v) ව්‍යාපාරයකට පිරිවැය අවම කර ගත හැකි ක්‍රම **හතරක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

5. (i) ව්‍යාපාරයක 'අභ්‍යන්තර පරිසරය' යන්න නිර්වචනය කරන්න.
(ii) ව්‍යාපාර අවස්ථා ඇගයීමේ ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.
(iii) පාරිභෝගික හැසිරීම කෙරෙහි බලපාන පෞද්ගලික සාධක **දෙකක්** දක්වන්න.
(iv) 'පාරිභෝගික ඉලක්කකරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පහදන්න.
(v) ඉලක්ක වෙළෙඳපොළ හඳුනාගැනීම තුළින් ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රතිලාභ **හතරක්** දක්වන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

6. (i) 'ව්‍යාපාර සැලැස්මක්' යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(ii) ව්‍යාපාර සැලසුමක ඇතුළත් කරුණු **හතරක්** සඳහන් කරන්න.
(iii) කාණ්ඩ නිෂ්පාදනය සඳහා උදාහරණ **දෙකක්** දෙන්න.
(iv) මූලාශ්‍ර ලේඛනවලින් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.
(v) භාණ්ඩ බෙදාහැරීමේ සෘජු ක්‍රමය සහ වක්‍ර ක්‍රමය අතර වෙනස පහදන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

7. (i) පහත ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරන්න.
(අ) අයිතිකරු රු. 500 000 ක් ව්‍යාපාරයේ ආයෝජනය කිරීම
(ආ) රු. 50 000 ක භාණ්ඩ තොග අත්පිට මුදලට ගැනීම
(ඉ) පිරිවැය රු. 20 000 ක් වූ භාණ්ඩ රු. 30 000 කට ණයට විකිණීම
(ඊ) රු. 15 000 ක දුරකථන බිල පියවීම
(උ) රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම

(ලකුණු 05 යි)

(ii) ජනකගේ ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | රු. |
|---|---|
| විකුණුම් | 1 000 000 |
| විකුණුම් පිරිවැය | 450 000 |
| වැටුප් | 100 000 |
| රක්ෂණ ගාස්තු | 40 000 |
| බැංකු ණය | 200 000 |
| යන්ත්‍ර ක්ෂය | 30 000 |
| විදුලි වියදම් | 40 000 |

**අවශ්‍ය වන්නේ,**

ජනකගේ ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය

(ලකුණු 05 යි)
(මුළු ලකුණු 10 යි)

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka